3 වන පිටෙන්

මේ කථාව රත්නපුරේ කතාව හා සමානය. රත්නපුරේ සිදුවූයේ එකම එක සිද්ධියකි. හරියටම මුස්ලිම් පූජකතුමා නිදා ගන්නා කාමරයටම ප්‍රහාරය එල්ල විය. පොලිස් නිලධාරියෙකු සිද්ධිය දුටු අතර ඔහුගේ කෑ ගැසීම නිසා මිනිසුන් දිව ආවේය. පැමිණි අය බයිසිකලය දමා පැන ගියෝ ය.





බයිසිකලයේ අයිතිකරු අනුව ප්‍රහාරයට පැමිණි උ.පෙ. ළමයා අත්අඩංගුවට ගෙන ඇත. වයස යන්තම් 18 කි. නමුත්, අවුරුදු 4-5 කට පෙර කුරගල ට ගහන්නත් ගිය දරුවෙකි. ඔහුගේ උප-දේශකයා මහනුවර "අක්කා කෙනෙකි" අක්කා තවම අසුවී නැති නිසා අක්කා ගේ මල්ලිලා ටික ගැන ද තවම දන්නේ නැත.

2009 යුද්ධය අවසන් වන විට මේ ළමයින්ට අවුරුදු 9 ක් නැත්නම් 10 කි. යුද්ධය ඔවුන්ට මතක නැත. ආනමඩුවේ ද, රත්නපුරේ ද, කාලකන්නි නරුමයින් විනාශ කර ඇත්තේ මේ මල් වැනි ළමයින් ගේ සිත් ය. මේ වැඩේ පිටුපස සිටින නරුමයින් හඳුණා ගැනීම වැදගත්වන්නේ මේ නිසාය. ඇත්තටම, ස්කූටියේ නැගී ගිය සා.පෙ. සිසුවෙකු රටක් ගැන, ජාතියක්, ආගමක් ගැන කුමන නම් අවබෝධයක් නිසා ලක්ෂ ගණනකට කන්නට දුන් වෙළෙඳසැලක් ගිණි තබන්නට ඇති ද?

**ඉගෙනගන්නවා නම් ආනමඩුවෙන් ඉගෙන ගත හැකි බොහෝ දේ තිබේ**

# කැන්බරා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට විවෘත ලිපියක්

අපි ඔහුට අනුර යයි කියමු. මෙල්බන් හි ජීවත් වන අනුර සිය සොහොයුරා සහ ඔහුගේ බිරි_ නිවාඩුවක් ස_හා ඔස්ට්‍රේලියාවට ගෙන්වා ගත්තේ ය. නිවාඩුව අවසන් කරන්නට දින කීපයක් තිබියදී මේ කාන්තාවට හෘදයා-බාධයක් වැළඳුනි. ඇය වහාම රෝහල් ගත කෙරුණි. වෛද්‍ය උපදේශය වූයේ ඇය තවත් දින කීපයකට වඩා ජීවත් කරන්නට නොහැකි බවය. ළගලම ඥාතීන්ට හැකි ඉක්මණින් පැමිණ ඇය මිය යන්නට පෙර ඇය දැක ගන්නා ලෙසද අපදසේ ලැබුණි. කාන්තාවගේ ලංකාවේ සිටි පුතා වහා ඔස්ට්‍රේලියාවට ගෙන්වාගත් නමුත් කුවේටිහි සිටි පුතා ගෙන්වා ගැනීමේ අපහසුවක් මතුවූයේ ඒ ස_හා වීසා නිකුත් කෙරෙනුයේ මැද පෙරදිග වෙනත් රටකින් නිසා ය. මේ ශෝකජනක අවස්ථාවේ අනුර ඇතුලු පිරිස පත්වූයේ මහත් අපහසුතාවකට ය.

මේ අවස්ථාවේ කැන්බරා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ඇමත_ අනුර කුවේටිහි සිටින දරුවා ඔහුගේ අම්මා මිය යන්නට පෙර මෙල්බන් වලට ගෙන්වා ගන්නට මැදිහත් වන ලෙස ඉල්ලා සිටියේ ය.

අනුර කියන පරිදි මහ කොමසාරිස් කාර්යාලයෙන් ලැබී ඇත්තේ අපූරු පිළිතුරකි.

"ඔබ ඔස්ට්‍රේලියා පුරවැසියකු බැවින් අපට උපකාර කළ නොහැකිය"

මේ අපූරු පිළිතුර ගැන අනුර කියන්නෙ මෙවැනි අදහසකි.

"මම ඔස්ට්‍රේලියා පුරවැසියෙක් වුණත් මගේ මල්ලි ශ්‍රී ලාංකිකයෙක්. මේ අසනීපවෙලා මිය යන්නෙ ශ්‍රී ලාංකිකයෙක්. අපි ගෙන්නලා දෙන්න උත්සාහ කරන්නෙ ඇගේ දරුවා වෙච්ච ශ%ී ලාංකිකයෙක්.. මෙතනට මගේ පුර-වැසිභාවය පිළිබ_ ප්‍රශ්නයක් වැදගත් වෙන්නෙ කොහොමද? අපි ඉල්ලුවේ මියයමින් ඉන්න ශ්‍රී ලාංකිකයෙක් බලන්න ඇගේ පුතාට මෙහෙට ගෙන්න ගන්න සහයෝගයක් දෙන්න කියලයි. මේ වගේ මානුෂික අවස්ථාවකදි අපේ මහ කොමසාරිස් කාර්යාලයේ හැසිරීම මේක නම් මේ මහකොමසාරිස්
කාර්යාලයෙන් වෙන මොන දෙයක් අපි බලා පොරොත්තුවෙන්නද?"

මෙවැනි අතිශය මානුසික ප%ශ්නයකදී ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය මොකක් හෝ හේත=වක් කියා ඉවත බලාගන්නවා නම් එය අනුමත කළ හැක්කන් නොවේ. මේ ගැන කැන්බර් ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්යාලයේ පැහැදිලි කිරීම කුමක්දැයි දැනගන්නට අපි කැමැත්තෙමු. ඔවුන්ගෙන් පැහැදිලි කිරීමක් ලැබෙන්නේ නම් එය පළකරන්නට අප සූදානම් ය.

## සන්නස Cartoon by PK




සන්නස ගිණුම් අංකය

**Account Name - Sannasa Pty Ltd**
BSB - 013303
Accout Number - 208133398

**වෙළඳ දැන්වීම්**
Sannasa Advrertising
**සාලිය ගලප්පත්ති / Saliya galappaththie**
0422 671 826

**එස් ජයසිංහ / S Jayasinghe**
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

email - sannasanews@gmail.com